ඔබ අලය්කස් සලාම් යැයි නොපවසනු. හේතුව සැබැවින්ම අලය්කස් සලාම් යැයි පැවසීම මිය ගිය ඇත්තන් සඳහා තිබෙන පැතුමකි.

අබූ ජුරය් අල් හුජය්මී -රළියල්ලාහු අන්හු- තුමා විසින් වාර්තා කරන ලදී. මෙය මර්ෆූඃ
ගණයට අයත් හදීසයකි. මම අල්ලාහ්ගේ දූතයාණන් -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා වෙත පැමිණ, අල්ලාහ්ගේ දූතයාණනි, අලය්කස් සලාම් යැයි පැවසුවෙමි. එතුමා: ඔබ අලය්කස් සලාම් යැයි නොපවසනු. නියත වශයෙන්ම එසේ අලය්කස් සලාම් යැයි පැවසීම මිය ගිය ඇත්තන් සඳහා තිබෙන පැතුමෙකු. යැයි පැවසූහ. [පූර්ව සාධක සහිත හදීසයකි] [ඉමාම් තිර්මිදි එය වාර්තා කර ඇත - ඉමාම් අබූ දාවූද් එය වාර්තා කර ඇත]

හදීසයේ අර්ථය: සැබැවින්ම මිනිසෙකු නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා වෙත පැමිණ අල්ලාහ්ගේ දූතයාණනි, අලය්කස් සලාම් යනුවෙන් පවසා සලාම් පැවසූහ. එවිට ඒ අයුරින් සලාම් පැවසීමෙන් නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා ඔහුව වැළැක්වූහ. ඒ ගැන තිබූ පිළිකුල හේතුවෙන් එතුමා ඔහු වෙත සලාම් නොපැවසූහ. නියත වශයෙන් එම පැතුම මිය ගිය ඇත්තන් සඳහා කියනු ලැබෙන බව එතුමාණෝ ඔහුට විස්තර කළහ. පසුව තවත් හදීසයක සඳහන් පරිදි ඔබ අස්සලාමු අලය්ක යනුවෙන් පවසන්නැයි ආගමානුගත සලාම් ක්රමය එතුමාණෝ ඔහුට පැහැදිලි කළහ. අලය්කස් සලාම් යනු මරණයේ පැතුම වේ යැයි නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- කළ ප්රකාශය සැබැවින්ම මිණීවලවල් බැහැ දැකීමේදී ඉදිරිපත් කළ යුත්තක් බව අදහස් නොකෙරේ. හේතුව කබ්ර් ස්ථාන බැහැ දකින අවස්ථාවේ අස්සලාමු අලය්කුම් අහ්ල දාරි කව්මි මුඃමිනීන් යන පැතුම නබි - සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා පවසා ඇති බවට පූර්ව සාධක සහිත හදීස් වාර්තා වී ඇති බැවිනි. එතුමා එසේ පවසා සිටියේ මිය ගියවුන් සඳහා ප්රාර්ථනා කිරීමෙහි අඥාන ජනයා අතර පැවති පුරුද්ද පෙන්වා දීමක් වශයෙනි.

http://sunnah.global/hadeeth/si/show/3770